# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1803/24 – 2013 මාර්තු 28 වැනි බ්‍රහස්පතින්දා – 2013.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: මැ/ආසංඉ/1/1/2/II වෙළුම.
ඉඩම් අමා. අංක: එල්ඩී/05/2009/පීටී/II.

මැදගම තැපැල් කාර්යාලය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි මොනරාගල මැනුම් අධිකාරී විසින් පිළියෙල කර ඇති අ.ග.පි. 163 අතිරේක අංක 15, පත්‍ර අංක 14 හි දැක්වෙන ඉඩම.

01. **කැබලි අංක 98**
ඉඩමේ නම: දෙමටකැටිය; හිමිකම් කියන අය: නූර් මොහොමඩ් සිත්ති සුබෙයිදා, අංක 172, මැදගම; ප්‍රමාණය: හෙක්. 0.1414.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මැයි මස 16 වැනි දින පෙ.ව. 10.00 ට මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 මැයි මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. එච්. ඒ. කේ. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
මැදගම.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 – 374

---

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: බිය3/1/1/231.

වර්ෂ 2011 ජූලි මස 25 වැනි දින අංක 1463 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද දැන්වීමේ සඳහන් මු.පි.ගම්. 3464 දරන මූලික පිඹුරේ කැබලි අංක 15 කැබලි අංක 78, 79 වශයෙන් සහ කැබලි අංක 09, 10 කැබලි අංක 80, 81 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

**කැබලි අංක 78**
ඉඩමේ නම: වරි. අංක 8, සියඹලාපෙ පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩී. එස්. වික්‍රමාරච්චි, අංක 374/බී, උඩුපිල, දෙල්ගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0040.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැබලි අංක 79**

ඉඩමේ නම: වරි. අංකය සොයාගත නොහැක, සියඹලාපෙ පාර; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජයලත්ගේ ශාන්ත ප්‍රේමසිරි ජයලත්, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0016.

**කැබලි අංක 80**

ඉඩමේ නම: වරි. අංකය සොයාගත නොහැක, සියඹලාපෙ පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සන්ධ්‍යා අලහකෝන්, දෙල්ගොඩ පාර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0606.

**කැබලි අංක 81**

ඉඩමේ නම: වරි. අංකය සොයාගත නොහැක, උඩුපිල පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි දෙකක කොටස් සහ සහ වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සිසිර අලහකෝන්, 514/1, දෙල්ගොඩ පාර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0229.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 අප්‍රේල් මස 29 වැනි දින පෙ.ව. 10.00 ට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 අප්‍රේල් මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් පිඹුරු අංකය සහ කැබලි අංකය සඳහන් කරමින් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

චම්පිකා ඩී. ධර්මසේන,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2013 මාර්තු මස 20 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 – 375